**මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**------**

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

---

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 133 | විද්‍යායතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකර ද නොතිබුණි. | අප ආයතනයේ අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකිව තිබේ. එබැවින් අභ්‍යන්තර විගණනයන්ද සිදුකිරීමට අපහසුවී තිබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 757 (2) | 2021 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණු පිරිවැය රු.1,118,813 ක් වූ විෂමතා හා ඌනතා සහිත භාණ්ඩ වර්ග 24 ක් සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 01 දින වන විටත් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් වූ ඌනතා, කැඩීම් සහ භාවිතා කළ නොහැකි ලෙස සඳහන්වූ භාණ්ඩ සම්බන්ධයෙන් නැවත සොයාබැලීම සඳහා තාක්ෂණික දැනුම සහිත කමිටුවක් පත්කොට විධිමත් වාර්තාවක් ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක පී.ඊ.ඩී 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 ඡේදය | අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කිසිදු විගණන කමිටුවක් පවත්වා නොතිබුණි. | අප ආයතනය තුළ විගණන සහ කළමනාකරණ කමිටුවක් නොමැති බැවින් 2020 වර්ෂය සඳහා වූ විගණන සහ කළමනාකරණ කමිටුව 2021/03/11 වෘත්තිය තාක්ෂණ විද්‍යාලයේදී පවත්වන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,475,761 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,488,772 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,964,533 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා වන වියදම රු.646,554 කින් හා සේවක පිරිවැය රු.3,453,285 කින් වැඩියෙන් වියදම් වීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) එක් පාඨමාලාවකට සිසුන් 35 ක් බැගින් වූ ප්‍රමාණයක් බඳවා ගැනීම සඳහා ආයතනයේ සම්පත් වෙන්කර තිබුණු නමුත්, විලේපනවේදය, සත්කාරක සේවා කළමනාකරණය, ශීතකරණ හා වායු සමීකරණ සහ සංචාරක සේවා කළමනාකරණය යන පාඨමාලා හතර සඳහා පිළිවෙලින් අයදුම්පත් 41ක්, 71ක්, 24ක් සහ 71 ක් ලැබී තිබුණද උක්ත පාඨමාලා 04 සඳහා සමාලෝචිත | 2019 ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් ලියාපදිංචි වීමේ සාපේක්ෂ අඩුවක් පෙන්නුම් කරයි. අනෙකුත් පාඨමාලා හා සසඳන විට මෙම පාඨමාලා සඳහා ලැබෙන අයදුම්පත් ප්‍රමාණයද අඩුය. නමුත් ඊට පසුව බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායම් වල සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කරයි. මේ වනවිට බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායම් වල නියමිත සිසුන් ප්‍රමාණය සම්පූර්ණ කිරීමට පියවර ගනිමින් සිටි. අනෙකුත් පාඨමාලා සඳහා සුදුසුකම් නොලබන සිසුන් මෙම | පාඨමාලා සඳහා යොදවන ලද සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂය තුළදී බඳවා ගෙන තිබුණු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 11ක්, 22ක්, 14ක් හා 23 ක් වැනි ඉතා අඩු ප්‍රමාණයක් වී තිබුණි. තවද සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් රු.674,100 ක ප්‍රචාරණ වියදමක්ද ආයතනය විසින් දරා තිබුණි. ඒ අනුව එම පාඨමාලා සඳහා යොදවා තිබුණු සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ හැකිවීමේ අවස්ථා අහිමිවී තිබුණි. | පාඨමාලා සඳහා සුදුසුකම් සපුරා ඇත්නම් සම්මුඛ පරීක්ෂණ වට කිහිපයක් හරහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ)සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගෙන විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා 06 ක විෂයයන් 33 ක දේශන පැවැත්වීම සඳහා සැලසුම් කර තිබූ පැය ප්‍රමාණය 3464 ක් වුවද දේශන පවත්වා තිබුණේ පැය 756 ක් පමණි. ඒ අනුව සැලසුම් කළ පැය 2708 ක් දේශන පවත්වා නොතිබුණි. | Covid 19 හමුවේ දේශන පැවැත්වීම online ක්‍රමය හරහා සිදුකෙරුණි. සාමාන්‍ය පන්ති කාමරයක් තුළ දේශන පවත්වන්නාක් මෙන් online දේශන තුළ සිසුන් රඳවාගත නොහැක. තවද පන්ති කාමරවල දේශනවලට වඩා වැඩි වේගයකින් online දේශන කරගෙනයාම සාමාන්‍ය තත්ත්වයකි. එමනිසා මෙහිදී අදාළ විෂය මාලාව සම්පූර්ණකර ඇති අතර සාමාන්‍ය පන්ති කාමරයක සැලසුම් කළ දේශන පැය ප්‍රමාණය online ක්‍රමය හරහා සම්පූර්ණ කර නොමැත. | සැලසුම් කළ දේශන පැය ප්‍රමාණයට අදාළව දේශන පැවැත්විය යුතුය. |
| (ඇ) විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන හෙක්ටයාර 0.5854 ක ඉඩම හා ගොඩනැගිලි විද්‍යායතනයේ නමට පවරා ගැනීමට 2022 ජුනි 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපිත කර ඇති හෙක්ටයාර 0.5854 බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම මාතර ප්‍රාදේශීය ලේකම් විසින් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. එම ඉඩමේ භුක්තිය අමාත්‍යාංශය යටතේ පවතින බැවින් මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය පවත්වා ගෙන යාමේ හා සංවර්ධන කටයුතු කිරීමේ කිසිදු බාධාවක් නොමැති බව අමාත්‍යාංශය මගින් දන්වා ඇත. | ඉඩම විද්‍යායතනයේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 දෙසැම්බර් මාසයේදී රු.1,250,000 ක් වැයකර මිල දී ගෙන තිබුණු මෝටර් රථ එසවුම සමඟ | ස්වයං චලන පාඨමාලාව සතුව ඇති මෝටර් රථ එසවුම සමඟ ඇති, රෝද එක එල්ල සකසන උපකරණය ස්ථාපනය කිරීමේ ඉඩකඩ පිළිබඳ ප්‍රයෝගික ගැටළු පවතී. මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා ආසන්න වශයෙන් දිග අඩි 38, උස අඩි 20 හා පළල අඩි 15 පමණ ඉඩකඩ සහිත | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මිලදී ගත යුතු අතර මිලදී ගන්නා ලද උපකරණ අදාල |

| | | |
|---|---|---|
| ඇති, රෝද එක එල්ල සකසන උපකරණය (Vehicle Hoist and Wheel Alignment) 2022 මාර්තු 24 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි. | ගොඩනැගිල්ලක් අවශ්‍යවේ. අදාල උපකරණය සවිකිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් මෙම ආයතනයේ නොමැත. විකල්ප ඉඩමක් ලබාදෙන ලෙස UNIVOTEC ආයතනය සහ අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති නමුත් තවමත් ඉඩමක් ලැබී නොමැත. අප ආයතනයට විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණ නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරමි. | කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය. |